# INCOMPLETE RECORDS (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# අසම්පූර්ණ වාර්තා

## ප්‍රාග්ධනය ගණනය කිරීම

අසම්පූර්ණ වාර්තා ගැටලු වලදී ගිණුම් කාලච්ඡේදය ආරම්භක දිනට ඇති වත්කම් වගකීම් පදනම් කර ගෙන ආරම්භක ප්‍රාග්ධනය ගණනය කළ හැකිය.

## මුදල් පොතක් පිළියෙල කර, එමගින් අනාවරණය කළ හැකි දත්ත

- අත්පිට විකුණුම්
- ණයගැති ලැබීම්
- අත්පිට ගැණුම්
- ණයහිමියන්ට ගෙවීම්
- මුදල් ගැනිලි
- මුදල් ශේෂය
- බැංකු තැන්පතු

ClassWork.LK

## ණයගැති පාලන ගිණුම පිළියෙල කිරීමෙන් සොයාගත හැකි තොරතුරු

- ණයගැති ආරම්භක ශේෂය
- ණයට විකුණුම් ශේෂය
- ණයගැති ලැබීම්
- අවසාන ණයගැති ශේෂය

## ණයහිමි පාලන ගිණුම පිළියෙල කිරීමෙන් සොයාගත හැකි තොරතුරු

- ණයහිමි ආරම්භක ශේෂය
- ණයට ගැනුම්
- ණයහිමියන්ට ගෙවීම්
- අවසාන ණයහිමි ශේෂය

ClassWork.LK

# ක්ෂය වූ ප්‍රමාණය සොයාගැනීම

අසම්පූර්ණ වාර්තා ගැටලු වලදී ගිණුම් කාලච්ඡේදය ආරම්භයේ තිබූ ස්ථාවර වත්කම්වල වටිනාකම් හා අවසාන දිනට වූ වටිනාකම් ඇසුරෙන් ක්ෂය වූ ප්‍රමාණය සොයාගත හැකිය.

ClassWork.LK

# <u>අභ්‍යාස</u>

(01) අසම්පූර්ණ සටහන් පවත්වා ගැනීමට හේතු ඉදිරිපත් කරන්න.

(02) අසම්පූර්ණ සටහන් ගැටලු විසඳීමේදී මුදල් ගිණුමක් මඟින් ලබා ගත හැකි අයිතම තුනක් සඳහන් කරන්න.

(03) ගිණුම් කාලච්ඡේදය ආරම්භයේ දේපළ පිරියත හා උපකරණවල වටිනාකම රු. 380 000 කි. වර්ෂය අවසානයේ ඒවායේ වටිනාකම රු. 350 000 කි. වත්කම් මිලට ගැනීමක් හෝ විකිණීමක් සිදු වී නැත්නම් වෙනස කුමක් ලෙස සලකන්නේ ද?

ClassWork.LK

(04)

ඉසුරු ව්‍යාපාරයේ තොරතුරු

වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | රු. | රු. |
|---|---|---|
| අයිතම | 2016/4/1 | 2017/3/31 |
| යන්ත්‍ර උපකරණ | 120 000 | 180 000 |
| ලී බඩු සවි කිරීම | 80 000 | 60 000 |
| භාණ්ඩ තොගය | 30 000 | 40 000 |
| ණයගැතියෝ | 45 000 | 53 000 |
| මුදල් | 15 000 | - |
| උපචිත මෙහෙයුම් වියදම් | 3 000 | 4 000 |
| ණයහිමියෝ | 27 000 | 18 000 |

## අතිරේක තොරතුරු

වර්ෂය තුළ රු. 80 000 ක යන්ත්‍රයක් ලබා ගත් අතර, රු. 10 000 ක ලී බඩු උපකරණ, වර්ෂය තුළ රු. 12 000කට විකුණා ඇත.

මුදලින් ගෙවූ මෙහෙයුම් වියදම් රු. 17 000 කි.

ClassWork.LK

වර්ෂය තුළ රු. 50 000 ක බැංකු ණයක් ලබා ගෙන රු. 55 000 ක් ගෙවා, එම ණය වර්ෂය තුළ නිදහස් කර ඇත.

පුද්ගලික ප්‍රයෝජනයට අයිතිකරු, රු. 6 000 ක් ලබා ගෙන ඇති අතර, රු. 15 000 ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යොදා ඇත.

ගිණුම් කාලච්ඡේදය තුළ ගනුදෙනුකරුවන්ගෙන් රු. 240 000 ක් ලැබී ඇති අතර, දුන් වට්ටම් රු. 4 000 කි. කාලච්ඡේදය තුළ දී ණයහිමියන්ට මුදල් ගෙවීමේ දී රු. 5 000 ක වට්ටමක් ලැබුණි.

පිරිවැයට 33 1/3% ක් ලාභ තබාගෙන කාලච්ඡේදය තුළ භාණ්ඩ විකුණා ඇත.

අවශ්‍යවන්නේ,

(1) ආදායම් ප්‍රකාශනය පිළියෙළ කිරීම
(2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙළ කිරීම

ClassWork.LK



පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
ACCOUNTING
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
26
ලියාපදිංචි වීමට :-
076 36 55 550
සෙනසුරාදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura